# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 12(1)
12(2)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 05/03/2018 |

පැමිණිලිකරු : එච්.එම්.පී.එන්.කේ. කලුහෙන්දිවල ඇතුළු පිරිස,
නුගහපොල වලව්ව.
පල්දෙනිය, මහවෙල.

වගඋත්තරකරුවන් :

01 ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

02 අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

03 අධ්‍යක්ෂක ජනරාල්,
වෙළද හා තීරුබදු වාහන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

04 විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

05 ආයතන අධ්‍යක්ෂ ජනරාල්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

06 ලේකම්.
ජාතික වැටුප් කොමිෂන් සභාව.
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව.
කොළඹ 07.

07 කම්කරු කොමසාරිස් ජනරාල්.
කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව.
නාරාහේන්පිට.
කොළඹ 05.

පැමිණිලි අංකය : **HRC/3646/16**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරුවන් වන ඒ.ඩබ්.එම්.ආර්. බණ්ඩාර, එච්.එම්.පී.එන්.කේ. කලුහෙන්දිවල හා එල්.ඩබ්.ඩී.එස්.එස්. රාජවික්‍රම යන අය විසින් මෙම පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ. තමන් මින් පෙර තිබූ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ විධායක ශ්‍රේණියේ තනතුරක් වූ කෘෂිකර්ම කළමණාකාර තනතුරට 1984/1985 යන වර්ෂ වල සේවයට බැඳුනු බවත්. 1993.01.01 දින සිට 1995.12.31 දක්වා වූ කාලය තුළ පෙර සේවා කොන්දේසි යටතේම ඔවුන්ගේ තනතුරු නාමය පමණක් සහකාර අධ්‍යක්ෂක ලෙස සංශෝධනය කළ බවත්ය. 1994 වසරේදී මෙම නිලධාරීන් සේවයෙන් පහ කරන ලද්දේ දේශපාලන පළිගැනීමක් මත බවද ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ SC(FR)/38/95 හා 65/95 යන මූලික අයිතිවාසිකම් නඩු කටයුතු විභාග කොට නැවත පෙර තනතුරු නාමය සංශෝධනය කර කෘෂිකර්ම පර්යේෂණ හා එළදා වර්ධන නිලධාරී ලෙස තබා එහෙත් පෙර තනතුරෙහි සේවා කොන්දේසි යටතේම පිහිටුවන ලෙසට තීන්දුවක් මෙන්ම 1995.12.13 දින අමාත්‍ය මණ්ඩල තීරණයක්ද අංක 95/2854/105/206 යටතේ ලබා දුන් බවද දක්වා ඇත.

පැමිණිලිකරුවන් සේවය කළ කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය 2003.07.09 දින අංක 3/1114/107/032 යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් මත ඈවර කිරීම 2002.12.31 දින සිදු කළ බවද පැමිණිලිකරුවන් සේවය කළ විධායක ශ්‍රේණියේ වූ තනතුර එකී සේවා කොන්දේසි හා භුක්ති විඳින ලද වරප්‍රසාද යටතේම කෘෂිකර්ම අමාත්‍යාංශයට අන්තර්ග්‍රහනය කර ලබාදී ඇත්තේ ද මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බවද පෙන්වා දී ඇත. 2003.01.01 දින සිට කෘෂිකර්ම අමාත්‍යාංශයට අන්තර්ග්‍රහනය කළ පසු එතෙක් පැමිණිලිකරුවන් ලබමින් සිටි විධායක ශ්‍රේණියේ වැටුප් පරිමානය වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 යටතේ T.5.7 වැටුප් පරිමානයේම තබා ඇති බව පෙන්වා දී ඇති අතර. පසුව 2011.04.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට අනුයුක්ත කර ඇත්තේද පෙර සේවා කොන්දේසි හා වරප්‍රසාද යටතේම බවත්. තවදුරටත්

පොහොර ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටින බවත් පෙන්වා දී ඇත. කළමණාකරන සේවා චක්‍රලේඛ 30 ට අනුව 2006.01.01 දින සිට විධායක ශ්‍රේණියේ වැටුප් පරිමාණයක් වන MM 1-1-2006 හි පිහිටුවා වැටුප් ගෙවීමට අනුමැතියද පැමිණිලිකරුවන් ලබා ඇති බව දක්වා ඇත. 2015.04.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2003.01.01 දින සිට විශ්‍රාම වැටුප් හිමිකමද MM 1-1-2006 වැටුපට අනුරූපීව 2015.01.01 දින සිට SL-1-2006 හි තැබීමටද අනුමැතිය පැමිණිලිකරුවන්ට හිමිව තිබූ බව දක්වා ඇත. නමුත් වැටුප් පරිවර්තනය සිදු කිරීමේදී උපයා ගත් වැටුප් වර්ධක ලබා නොදෙමින් නිවැරදි ආකාරයකට ගණනය කර නොතිබීම හා අනුරූපී වැටුප් පියවරේ නිවැරදිව ගලපා නොතිබීමේ හේතුව මත වැටුප් පියවර නිවැරදි ලෙස ගණනය කර පිහිටුවන ලෙසද ඔවුන්ට හිමිවිය යුතු පාරිතෝෂික මුදල් ගෙවන ලෙසද හිඟ වැටුප් මෙන්ම තනතුරට අදාළව ලැබිය යුතු උසස්වීම් හා තීරුබදු රහිත වාහන බලපත්‍රය ලබා දෙන ලෙසද කරන ලද ඉල්ලීම් වගඋත්තරකරුවන් විසින් ලබා නොදීමේ හේතුව මත හා තම ඉල්ලීම්ද අභියාචනාද නොසලකා හැර තබීම මත තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට පැමිණිල්ලේ කරුණු දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2017.03.15 දින තම පිළිතුරු වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් දක්වා ඇත්තේ. පැමිණිලිකරුවන් හට හිඟ වැටුප් ගෙවීම සම්බන්ධව විගණන අධිකාරියේ විගණන විමසුමක් 2016.02.29 දින සිදු කර ඇති බැවින් හිඟ වැටුප් ගෙවීම සම්බන්ධව ගැටළුවක් ඇතිවේද යන්න පිළිබඳව කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අවස්ථා කීපයකදී විමසීම් කර ඇතත් 2017.05.24 දින ඊට පිළිතුරු ලෙස 2017.08.15 දිනැතිව කරුණු ඉදිරිපත් කරමින් පෞද්ගලික ලිපි ගොනුවේ තොරතුරු අනුව උපයා ගත් වැටුප් වර්ධක ලබා දෙමින් හා 2015.04.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කර නිවැරදිව වැටුප් පරිවර්තනය සිදු කරන බව කොමිසම වෙත දන්වා ඇත.

තවදුරටත් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව 2016.02.15 ලිපියෙන් අනුමත තනතුරු සඳහා වූ උසස්වීම් පටිපාටිය සකස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන බවත් එය ආයතන අධ්‍යක්ෂ ජනරාල් මඟින් ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම් මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කර ඇති බවත් පෙන්වා දී ඇත.

කෘෂිකර්ම අධිකාරියේ පැමිණිලිකරුවන් සේවය කරන කාලය සඳහා හිමි පාරිතෝෂික දීමනා අවශ්‍ය ගණනය කිරීම් නීති අංශයට යොමු කර ඇති බවද අනුමැතිය ලද විගස ගෙවීම් කටයුතු කරන බවද තවදුරටත් දන්වා ඇත.

වැටුප් පරිවර්තනය නිවැරදි බව කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තහවුරු කළ පසු විශ්‍රාම වැටුප ගණනය නිවැරදිව සිදුකිරීමට කටයුතු කරන බවද දන්වා ඇති අතර. තීරුබදු රහිත වාහන බලපත්‍ර

සඳහා මහජන පෙතසම් කාරක සභාවේ 2015.05.22 දිනැති පරීක්ෂණයේදී ලබා දුන් නිර්දේශය පරිදි කටයුතු කරන බවද ඒ සඳහා මසක කාලයක් ලබා දෙන ලෙසද ඉල්ලා සිට ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

2016.12.29 දින සිදු කරන ලද පරීක්ෂණයේදී පැමිණිලිකරුවන් ඉල්ලා සිටින සහන ලබාදීමට කටයුතු කරන බව වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිට ඇති කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කළ නිලධාරීන් විසින් කියා දන්වා ඇති අතර විශේෂයෙන් වැටුප් වර්ධක නිවැරදිව සකසා ඇති බවද ඒ අනුව නිවැරදිව වැටුප සකසා ගෙවීම් කිරීමට දින 7 ක් ඇතුළත ගිණුම් අංශයට දන්වා එසේ ගෙවූ බව කොමිෂන් සභාවට දන්වන බවටද කරුණු ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුවන් ඉල්ලා ඇති සහන අනුව ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇති බැවින් පැමිණිලිකරුවන් එම අවස්ථාවේ ඊට එකඟ වී ඇත. පසුව 2017.03.15 දින වාර්තාවක් ඉදිරිපත් කරමින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් දන්වා ඇත්තේ. හිඟ වැටුප් ගෙවීම සම්බන්ධව සහන ලබාදීමට බාධාවක් වී පවතින්නේ 2016.02.29 දිනැති විගණන විමසුම බවද කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඊට අදාළව කරුණු විමසා ඇති බවත් පිළිතුරු ලද පසු තීරණයක් ගන්නා බවත්ය. තවද උසස්වීම් පටිපාටිය සකසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යවා ඇති බවද එය ලද විගස උසස්වීම් සම්බන්ධව තීරණයක් ගන්නා බවද පාරිතෝෂික ගෙවීම ගණනය කර ඇති බවද නීති අංශයේ අනුමැතිය ලද පසු ගෙවීම් කරන බවද විශ්‍රාම වැටුප් හා වාහන බලපත්‍ර සම්බන්ධව ඒ අනුව තීරණයක් ගැනීම සිදු කළහැකි බව පෙන්වා දී ඇත.

තවද පැමිණිලිකරුවන් විසින් මෙතෙක් කරන ලද සියලු ඉල්ලීම් පිළිබඳව සලකා බලා සහන ලබාදීමක් සිදුව නොමැති බවට අනාවරණය වී ඇත. 2017.05.25 දින සිදුකරන ලද පරීක්ෂණය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ද නියෝජනයන් ඉදිරිපත්ව ඇත. පැමිණිල්ල පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළ පසු සහන ලබාදීමට අදාළව වැටුප් වර්ධක ගෙවීමට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අදාළ ලේඛන සකස් කර අංක 2/1/1/11/5 හා 2017.05.24 දිනැති ලිපිය අනුමැතිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බවට ප්‍රකාශ කර ඇත.. එකී අනුමැතිය පිළිබඳව තීරණයක් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මඟින් සලකා බලා දින 14 ක් පමණ වූ කාලයක් තුළ අවශ්‍ය නිර්දේශ කෘෂිකර්ම අමාත්‍යාංශයට එවීමට එකඟ වී ඇත. 2017.05.14 ලිපියට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක DS/0026-vol.11(T) හා 2017.08.15 ලිපියෙන් නිර්දේශයක් ලබා දී ඇති බවත් ඒ අනුව මෙම නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය සිදු කරන බවත් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. උසස්කිරීමේ පටිපාටිය අනුමත කළ පසු පැමිණිලිකරුට හිමි වියයුතු උසස්වීම් කඩිනමින් ලබා දීමටද එකඟ වී ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුවන් තම පැමිණිල්ලෙන් දක්වා ඇති පරිදි ඔවුන් කෘෂිකර්ම අධිකාරියේ සේවය කරමින් සිටියදී කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්ත කළ පසු පැමිණිලිකරුවන්ගේ වැටුප් පරිවර්තන නිසි ලෙස

සිදු නොකිරීමෙන් මෙම ගැටලු සහගත තත්වය ඇති වූ බවයි. මෙම වැටුප් පියවර නිවැරදි කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල තීරණ හා වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ නිසි ලෙස ක්‍රියාත්මක වී ඇති බවක් පෙනී නොයයි. ඒ අනුව පාරිතෝෂික මුදල් සම්බන්ධවද උසස්වීම් සම්බන්ධවද වැටුප් වර්ධක සම්බන්ධවද වැටුප නිසි ලෙස ගැලපීම සම්බන්ධවද තීරුබදු රහිත වාහන බලපත්‍ර ලබා නොදීම සම්බන්ධවද පැමිණිලිකරුවන් ඉල්ලා සිටින සහන පිළිබඳවද කරන ලද අභියාචනා දීර්ඝ කාලයක් ලිපි ලේඛන හා නිර්දේශ සඳහා ආයතන අත හුවමාරු වීමේ තත්වයක් පමණක් නිතර සිදුවී ඇති බව තවදුරටත් අද දින වනතුරුද ඒවා අවසන් වී නැති බවද අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වී ඇත.

පාරිතෝෂික මුදල් නොගෙවීම සම්බන්ධව පැමිණිලිකරුවන් විසින් කරන ලද පැමිණිල්ලකට අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කම්කරු කොමසාරිස්ගේ 2017.04.26 දිනැතිව කරන ලද විභාගයේදී අනාවරණය වී ඇත්තේ 2003.01.01 දිනට ගෙවන ලද රු 13975.00 ක වැටුප පදනම් කරගෙන අධිභාරයද සමඟ පාරිතෝෂික මුදල් ගණනය කර ගෙවන ලෙස දන්වා ඇති බවයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017.05.08 දින ලිඛිතව දක්වා ඇත්තේ එකී ගෙවීම් නිවැරදිව ගණනය කර ගෙවන ලෙසට වේ. එකී දැන්වීම ප්‍රධාන ගණකාධිකාරීට නියෝග කර ඇති බව නිරීක්ෂණය වේ. නමුත් විගණන විමසුමක් ඇති බව දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම ගෙවීම් කිරීම ප්‍රමාද කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන් විසින් මහජන පෙත්සම් කාරක සභාවට කරන ලද පැමිණිල්ලක් විභාග කළ පසු 2015.05.22 දින මහජන පෙත්සම් කාරක සභාවේ පැවති විභාගය පදනම් කරගෙන වගඋත්තරකරුවන්ට 2015.07.25 දින දක්වා ඇත්තේ, පැමිණිලිකරුවන්ට 2006.01.01 දින සිට ඔවුන්ගේ සේවා ශ්‍රේණියට හිමි MM 1-1-2006 වැටුප් බාණ්ඩයේ පිහිටුවා ඒ අනුව ඔවුන් උපයා ගත් වැටුප් වර්ධක ලබාදී හිමි වියයුතු නිවැරදි වැටුප ගලපා නොතිබූ බැවින් නියමිත දිනට එය ගලපා ලබා දියයුතු හිඟ වැටුප ලබා දෙන ලෙසට වේ.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පරීක්ෂණයේදී දක්වා ඇත්තේද කළමණාකරන සේවා චක්‍රලේඛ 30 ට අනුව 2006.01.01 දින සිට MM 1-1-2006 වැටුපේ පිහිටුවා 22 වැටුප් පියවරේ පිහිටුවා උපයා ගත් වැටුප් වර්ධක ලබාදී වැටුප් පරිවර්තනය නිවැරදිව සකස් කරන ලෙසට වේ. වැටුප් පරිවර්තනය නිවැරදිව සකස් කළ පසු 2015.04.29 දින අමාත්‍ය මණ්ඩලය තීරණය ලබාදී ඇති පරිදි 2015.01.01 දිනට කළමණාකරන සේවා චක්‍රලේඛ අනුව ලැබූ වැටුපට අනුරූපීව SL-1 වැටුප් පියවරේ තැබීමට නිර්දේශය ලබාදී තිබී ඇති බවද නිරීක්ෂණය වේ. එයට කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත්තේ 2017.05.24 දින බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට පැමිණි නිලධාරීන් විසින් පෙන්වා දී ඇත. නමුත් ආයතන අතර ලිපි හුවමාරු වීමේ කටයුතු පමණක් සිදුවන බවද තවදුරටත් එකී කටයුතු අවසන් වී නොමැති බවද නිරීක්ෂණය වේ.

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නිලධාරීන් පරීක්ෂණයේදී එකී වැටුප් පරිවර්තන දින 14 ක් තුළ නිර්දේශ කර ලබා දෙන බව දක්වා ඇතත් ඒවා තවදුරටත් සිදුව නැති බවද පැමිණිලිකරුවන් දෙදෙනෙකුම විශ්‍රාම ගොස් ඇති බවද පෙනී යන කාරණාවක් වේ. මහජන පෙත්සම් කාරක සභාව විසින්ද පැමිණිලිකරුවන්ට අදාළ උසස්වීම් ලබාදීමට නිර්දේශ ලබාදී ඇතත් නිවැරදි ලෙස උසස්වීම් ලබාදී අවසන් කර නොමැති බවද කරන ලද අභියාචනා සඳහා සලකා බැලීමක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ. විශ්‍රාම යාමට ආසන්නව සිටින මෙම නිලධාරීන්ට ලැබිය යුතු උසස්වීම් තවදුරටත් ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බවද උසස්වීම් ලබාදීමට අදාළ උසස්කිරීම් පරිපාටි සංශෝධනය කරමින් තවදුරටත් අනුමැතීන් සඳහා ඉදිරිපත් වීමේ කටයුතු පමණක් යොමුව පවතින බවද පෙනී යන අතර දීර්ඝ කාලයක් තිස්සේ මෙකී කටයුතු සිදුවන බවද හඳුනා ගතහැකි කාරණාවකි. 2015.04.29 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසර 2 කට අධික කාලයක් ගත වී ඇතත් උසස්වීම් හෝ පාරිතෝෂික හෝ වැටුප් පරිවර්තන හෝ නිසි ලෙස ලබා දී නැති බව අනාවරණය වේ. මහජන පෙත්සම් කාරක සභාවේ පරීක්ෂණයේදී ද තීරුබදු රහිත වාහන බලපත්‍ර ලබාදීම නිර්දේශ කර තිබීම අවධානය යොමු කළයුතු කාරණාවකි.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පරීක්ෂණ අනුව, පැමිණිලිකරුවන්ගේ සහන ලබාදීමට මහජන පෙත්සම්කාරක සභාව විසින් ලබා දෙන ලද තීරණ ද අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලද නිර්දේශයද කම්කරු කොමසාරිස් විසින් ලබා දෙන ලද නිර්දේශයන් ද සැලකිල්ලට ගෙන නිසි ලෙස කටයුතු කර නැති බැවින් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ලෙස කටයුතු කර ඇති බව කොමිෂන් විසින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව,

01 පැමිණිලිකරුවන්ට කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ කළ සේවය සඳහා හිමි පාරිතෝෂික මුදල් අධිභාරයද සමඟ 2003.01.01 දිනට ලද වැටුප වන රු. 13,975.00 පදනම් කරගෙන නිවැරදිව ගණනය කර ගෙවන ලෙසද,

02 විගණන විමසුමක් තිබීම, පෙත්සම්කරුවන් ඉල්ලා ඇති සහන ලබාදීම සම්බන්ධව බලපාන කාරණාවක් බවට දක්වා සහන ලබාදීම ප්‍රමාද කිරීමට හේතුවක් කර නොගත යුතු අතර කම්කරු කොමසාරිස් විසින් සිදු කළ පරීක්ෂණ අවසන් කර නිර්දේශ කළ පරිදි වැටුප් පරිවර්තනය නිවැරදිව සිදු කර හිඟ වැටුප ලබාදීම නිවැරදි වැටුප් පියවරේ තැබීමට පියවර ගතයුතු බවද, වගඋත්තරකරුවන්ගේ 2017.05.24 හා 2017.08.15 ලිපි වල නිර්දේශයන්ට අනුව

පැමිණිලිකරුවන්ගේ වැටුප් පරිවර්තන වලදී SL-1-2006 වැටුප් පරිමානය ලබා දෙමින් වැටුප් පරිවර්තනය කිරීමේදී ආයතන සංග්‍රහයේ VII:4:3 උප වගන්තිය අනුව 2015.01.01 දිනට වැටුපෙහි පිහිටුවිය යුතු බැවින්ද MM-1-1 වැටුප් පරිමානයේ 31 වන පියවරට අදාළ වැටුප SL-1-2006 වැටුප් පරිමාණයේ 33 හා 34 පියවරයන්ට අදාළ වැටුප් අතර යෙදෙන බැවින්ද 2015.01.01 දිනට 34 වන පියවරෙහි පිහිටුවීම නිවැරදි බැවින්ද ඒ අනුව සිදු කළ යුතු බවටද.

03 පැමිණිලිකරුවන් කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය වසා දමා 2003.01.01 දින කෘෂිකර්ම අමාත්‍යාංශයට අන්තර්ග්‍රහනය කරන ලද නිලධාරින් බැවින් මෙම නිලධාරීන් කෘෂිකර්ම සංවර්ධන අධිකාරියට බඳවා ගන්නා ලද මූලික සුදුසුකම් හා මොවුන් සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල් අනුමත කරන ලද 1993 උසස්වීම් පරිපාටියේ සුදුසුකම් හා 2015.04.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා මහජන පෙත්සම් කාරක සභාවේ නිර්දේශයන් ප්‍රකාරව මොවුන් කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේදී භුක්ති විදි සේවා කොන්දේසි හා වරප්‍රසාද සහිතවම ඔවුන්ට හිමි උසස්වීම් ලබාදීමට කටයුතු කළ යුතු බවටද.

04 තීරුබදු රහිත වාහන බලපත්‍ර ලබා ගැනීමට ඇති අයිතිවාසිකම පිළිබඳව මහජන පෙත්සම් කාරක සභාව විසින් කරුණු විභාග කර ලබාදී ඇති නිර්දේශය ප්‍රකාරව කඩිනමින් එකී බලපත්‍ර ලබාදීමට පියවර ගතයුතු බවටද මින් නිර්දේශ කරනු ලැබේ.

2018.04.05 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/